


## මෙම සමාගමේ  මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොල / කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොල පවතින පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ලත් පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## කාර්මික ශිල්පී (වඩු කාර්මික)11 වන ශ්‍රේණිය

**රැකියාවේ ස්වභාවය :** අධීක්ෂණ නිළධාරින් විසින් පවරනු ලබන, දොර, ජනෙල්, මේස පුටු හා අනෙකුත් භාණ්ඩ සෑදිම. වහලවල් තැනීම, උළු හෝ සීට් ඇතිරීම. දැව සාම්පල් තේරීම, කොන්ක්‍රීට් අච්චු (ෂටරින්) සෑදීම, සිවිලිම සවි කිරීම, පාටීෂන් බිත්ති සෑදීම, වැහි පීලි සවි කිරීම, පලංචි සවි කිරීම ආදී වඩු වැඩ ඇතුළු වෙනත් දෑ කිරීම.

**රැකියාවේ වගකීම් :**

I වඩුකාර්මික වැඩ කිරීමේදී ජව බලයෙන් සහ විදුලි බලයෙන් ක්‍රියා කරන වඩු වැඩ යන්ත්‍ර සහ උපකරණ ආරක්ෂාකාරී ලෙස පරිහරණය කිරීම හා නඩත්තු කිරීම.

11 වහලවල්, සිවිලිම් ආදිය කඩා ඉවත් කිරීම.

111 එදිනෙදා පවරනු ලබන වැඩ හා භාවිතා කරන ද්‍රව්‍ය පිළිබඳව වාර්තා තබා ගැනීම.

1V අධීක්ෂණ නිළධාරීන් නොමැති විට පණිවුඩ භාරගැනීම සහ අප්‍රමාදව එය ඔවුන්ට ලැබීමට සැලැස්වීම.

V රාජකාරී ඉටු කිරීම සඳහා විටින් විට නිකුත් කරන උපකරණ සහ ද්‍රව්‍ය වල වගකීම දැරීම.

VI රාජකාරී කාලය තුළ නිල ඇඳුමින් සැරසී සිටීම, එහි පිරිසිදු භාවය ගැන සැලකිලිමත් වීම හා රාජකාරී ස්වභාවය අනුව ආරක්ෂක ආවරණ පැළඳ සිටීම.

VII සේවා මුර ක්‍රමය යටතේ සහ හදිසි අවශ්‍යතා මත පවරනු ලබන අතිකාල වැඩෙහි යෙදීම.

VIII ස්වකීය භාරයේ පවතින  භාණ්ඩ හා උපකරණ පිරිසිදුව හා ආරක්ෂාකාරීව භාවිතා කර නැවත බාරදීම

IX අත් උදව්කරුවන් නොමැති අවස්ථාවලදී, ගබඩාවෙන් උපකරණ හා අමුද්‍රව්‍ය ලබා ගැනීම, වැඩ කරන ස්ථානයට ඒවා රැගෙන යාම සහ උපකරණ හා ඉතිරි ද්‍රව්‍ය නැවත ගබඩාවට බාරදීම

X පලංචි බැඳීම සඳහා බඩු භාර ගැනීම, පලංචි සවි කිරීම සහ ගැලවීම හා ඒවා නැවත භාරදීම.

XI කටුනායක ගුවන් තොටුපොල පරිශ්‍රයෙන් බැහැර රත්මලාන, පිදුරුතලාගල, කතරගම, මත්තල හෝ වෙනත් දුර බැහැර ස්ථානයන්හි අදාළ රාජකාරී ඉටු කිරීම.

**සුදුසුකම් :** (අ) ජාතික ආධුනිකත්ව මණ්ඩලයෙන්/ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරියෙන් නිකුත් කරනු ලැබූ වඩු කාර්මික ක්ෂේත්‍රයේ දැවුරුද්දකට (02) නොඅඩු පූර්ණ කාලීන පාඨමාලා සහතිකයක් හෝ දැවුරුද්දකට (02) නොඅඩු පූර්ණ කාලීන පාඨමාලාවක් හැදෑරීමෙන් අනතුරුව කාර්මික විද්‍යාලයක් මගින් නිකුත් කරනු ලැබූ වෘත්තිය ආධුනිකත්ව සහතිකයක් අදාළ ක්ෂේත්‍රයෙන් ලබා තිබීම.

**හෝ**

ජාතික වෘත්තිය සුදුසුකම් 4 වන මට්ටම (NVQ Level 4) වෘත්තිය සහතිකයක් වඩු කාර්මික ක්ෂේත්‍රයෙන් ලබා තිබිම.

සහ

(ආ) ආධුනිකත්ව කාලසීමාවද/ පාඨමාලාව කාලසීමාවද ඇතුලත්ව සිව් (04) වසරක පළපුරුද්දක් අදාළ ක්ෂේත්‍රයෙන් ලබා තිබීම.

**වයස :**

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන විට අවරුදු 35ට නොවැඩි විය යුතුය.

**වැටුප :**

තෝරාගනු ලබන්නන්හට සියළු දීමනා සහිත ආකර්ෂණීය වැටුපක් හා ප්‍රතිලාභ රැසක් හිමිවේ.

**බඳවා ගැනීමේ ක්‍රමය:** ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින්

**පොදු කරුණු :-**

මෙම තනතුර සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන් දිවයිනේ පිහිටි ඕනෑම ගුවන් තොටුපොලක අවශ්‍ය වූ විට සේවය කල යුතුවේ.

ඉහත සුදුසුකම් හා සේවා පළපුරුද්ද ලබා තිබේ නම් මෙම වෙබ් අඩවියේ ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව සකස් කල අයදුම්පතයක් පහත සඳහන් ලිපිනයට 2023 **ඔක්තෝබර් මස** 18 **වන දිනට** පෙර ලැබෙන සේ **ලියාපදිංචි තැපැලෙන් හෝ කුරියර් සේවා මගින් පමණක්** ඉදිරිපත් කළ යුතුවේ. අයදුම්පත් බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ **කාර්මික ශිල්පී (වඩු කාර්මික)** II **වන ශ්‍රේණිය** යන තනතුර සඳහන් කළ යුතුවේ

තෝරා ගැනීමේ ක්‍රියාවලියේ සෑම අදියරකදීම සුදුසුකම්ලත් අයදුම්කරුවන්ට පමණක් දැනුම් දෙනු ලැබේ.

පාඨමාලා සහතික හා සේවා සහතික සහ අදාළ සහතිකවල ඡායා පිටපත් සමග ඉදිරිපත් නොකරන අයදුම්පත් සහ අපගේ වෙබ් අඩවියේ ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව ඉදිරිපත් නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**සභාපති**
**එයාර්පෝර්ට් ඇන්ඩ් ඒවියේෂන් සර්විසස් (ශ්‍රී ලංකා) (ප්‍රයිවට්)ලිමිටඩ්**
**බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොල**
**කටුනායක**

Date :05/10/2023